# වනිතාවයි, වන සංරක්ෂණයයි

දූයක උපතට, දූයක් නැඟුමට, දූයක තැනුමට වනිතා දැතින් ඉටු වෙන මෙහෙය අපමණය. කොත නින් කොයිලෙස කිනම් අහරක් රැස්වුවත් එය මුළු ලොවටම කැ වෙන්නේ පෙවෙන්නේ වනිතා දැතිනි. ඇස සනහන පෙනුමට, සිත් රුචිකරන සුවඳට, කුස පුරවන රසයට අහර පිළියෙල කරන්නී ඇයයි. ලොවට මේ සැමදේ ලබා දෙන්නට ඈ ගන්නා වෙහෙස අපමණය. නන්විධ සූප සාස්ත්‍ර, නන්විධ සැරසිල්ලෙන් සැමගේ පසිඳුරන් පිනවන්නට ඈ ගන්නා වෙහෙස අපමණ ය.

එහෙත් ඒ සමගම ඇය දූයට විනාශයක් ලබා කරන්නියක්ද වන බැව් කීවොත් ඔබ මා හා එකඟ වන්නේද? බොහෝ වෙහෙසින් පස දියෙන් වතුරෙන් සසිරු කොට ගෙමිදුල සුන්දර වන්නට මල් පැල යක් ඉන්දන ඇය, ඇත්ත වශ යෙන්ම විනාශයක් ලබා කරන්නේ කෙසේද? කුසුම් පෙත්තක මුදු බවින්, ළදරු දෙතොලක මුදු බවින් මෝහනය වන ඇය එවන් සාහසික ක්‍රියාවක් කරයි ද ?

ඇත්තෙන්ම මෙම විනාශය සිදු වන්නේ ඇය, ඔබ හෝ මා හෝ දනගෙන නොවේ. ඇය එවන් විනාශයක් කරතැයි ඇය සිහිනයකිනුදු නොසිතන්නේය. අපට රසඅහරක් පිසින සැම මොහොතකම ඇය සොබාදහමේ විනාශයට රුකුල් දෙන්නීය. එහෙත් නොදන කළ වරදට සමා දීම උතුම් ගුණයකි. එබැවින් ඇය කරන වරද ගැන අප උරණ විය යුතු නැත. වරද මේ කුමක් දැයි ඔබ සිතනු ඇත. ඉන්ධන උදෙසා මහා වන ප්‍රමාණයක් වැය කිරීම ඇය කරන ජාතික අපරාධයයි.

ශ්‍රී ලංකාව, ජල, පස්, මිනිස් සහ වන සම්පත් වලින් ආසිරි ලත් රටෙකි. කලට ලැබෙන වැස්සෙන්, පින්බර දේශගුණයෙන් උතුම් මිනිස් දහමින් අප ලබන ප්‍රබෝධය අන්කිසි රටකට දෙ වැනි නැත. වසරින් අඩක් ගැහෙන සීතලින් හෝ පවසින් මිදෙන්නට බොන්නට ජලය නැති දූහයකින් හෝ අපට කරදරයක් නැති. එහෙත් අපට එවන් තත්ත් වයකට මුහුණ දීමට සිදුවුවහොත්!

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනී.

**අශෝකා ඩී. කේ. සේපාල**

**විසිනි.**

අප දූනට වන විනාශ කරගෙන යන අයුරින් තව දුරටත් කටයුතු කළහොත් එය සිදුවන දිනය වැඩි ඈතක නොවේ. 1956 වසරේදී ලක්බිමෙන් 44% වනයෙන් වැසී පැවතුනි. එය 1976 වන 22% දක්වා අඩු විය. දූනට ඇති මේ වන ප්‍රමාණයෙන්ද 18% ක් මහ වැලි සංවර්ධනයත් සමග විනාශ වී යනු ඇත. ඒ අතරින් ද 10%ක් පමණ ප්‍රමාණයක් ඉන්ධන දර ලෙස දැවී යනු ඇත. ඒ දැවී යන 10% ප්‍රමාණය සතු වගකීම සම් පූර්ණයෙන්ම වනිතාව බාර ගත යුතුය.

මහවැලි හැරුනු විට, කන්තලේ කවුඩුල්ල, රාජාංගන, පරාක්‍රම සමුද්‍රය සහ හුරුළුවැව ආදී දහසකුත් එකක් ගොවි ජනපද ව්‍යාපාර යට තේද උස්බිම් ජනාවාස ප්‍රාදේශීය සංවර්ධන යෝජනා ක්‍රම, තරුණ ගොවි ව්‍යාපාර, රජයේ දැව කැපීම් ව්‍යාපෘති ආදී මෙකී නොකී කටයුතු සඳහාද, කෙටියෙන් කිවහොත් සංවර්ධනයේ වර්ධනයත් සමගම සීඝ්‍ර ලෙස වනාන්තර පරිහානිය සිදුවී ගියේය. මේ වන විනාශය අපට ගණනය කළ හැකිය. එහෙත් හේන් වගාව, නීති විරෝධී ලෙස දැව කැපීම හා දර ඉන්ධන භාවිතය නිසා විනාශ වී ගිය වනාන්තර ප්‍රමාණය මේ ගණනය කිරීම් වලට ලක් නොවේ.

මෙනයින් බලන කල රටක සංවර්ධනය සමග එරට වන වගාවේ සීඝ්‍ර අපනතියක්ද සිදුවන බව අපට පෙනේ. එලෙසින්ම වැඩි වැඩියෙන් රසමසවුළු උයන්නට පිඟින්නට වනිතාවද වැඩි වැඩියෙන් දර භාවිත කරමින් මේ වන විනාශයට අත දෙයි.

ගසක් දැව සඳහා බිම හෙලන්නේ නම් එයින් අත්වන ප්‍රයෝජනය කුමක්ද? ගසක් කපන්නේ දැව සඳ හාමද? එසේය. ගසක් කපන්නේ දැව සඳහාත්, ඉන්ධන සඳහාත් පමණෙකි. සංවර්ධන බාධකයක් ලෙස ගසක් කැපී ඉවත් වන්නේ ඉතා කලාතුරකිනි. එසේ වුවද ගසක් හඳන්නේ පල ප්‍රයෝජන රැසක් සඳහාය.

මලින් පලින් බර තුරු ලතාවෝ සොබා සුන්දරත්වයේ නියමුවෝ වෙති. ලොව වායු ගෝලයේ අම්ල

කර වායුවෙන් 1/7 ක් පමණ නිපද වා සියොතුන්ට වන සීපාවන්ට, මිනිස් සිතට මිහි මඬල සුව යහනක් කරන්නෝ වෙති. දහය නිවන සෙවන සාදන්නේ ද, පවස නිවන ජලය ගෙනෙන වැසි කැඳවන්නේ ද ඔවුන් විසිනි. සිරිලක් පොලවේ සසිරු බව දියවී යා නොදී පස සුරකින්නේ ද තුරු ලතාවෝයි. එසේ නම් තුරුලතා ජීවීන්ට කරන මෙහෙය අපමණකැයි මිනිය හැකිද?

වායු සමීකරණයකින් ගතට ලැබෙන සිසිලට වඩා රුක් සෙවන සැපදයක බවත් කෘතිමව නිපද වෙන අම්ලකරයට වඩා සොබා දහමින් ඉබේ ලැබෙන අම්ලකර වායුවේත් අගය අප දනිමු. ඊට අමතරව පරිසරය අපවිත්‍ර කරන බොහෝ දේ අපට ප්‍රථම ගස්වැල් විසින් හඳුනා ගනු ලබයි. ගසේ හැදෙන පලතුරින් අප දිව පිනවයි. ඉබේ වැටෙන කොල, කොම් පෝස් පොහොර බවට පරිවර්තනය වෙයි. පිපෙන මලක පරාග පෝෂනයට උදව් වන මී මැස්සන් වැනි කෘමීන්, ගිරවුන් වැනි පක්ෂීන් උරගයන් වැනි සතුන් වනසන ඌරන්, වැනි බොහෝ වටිනා දෑ අපට ආරක්ෂා කර දෙයි. පිපෙන මලක සුවඳින්, ඉදුනු පලතුරක රසයෙන්, ඉබේ නැවෙන ලාදලු පතක් සෙලවෙන සුමිහිරි නදින් පසිඳුරන් පිනවන අපි අප සනහන එවන් දෑ විනාශ කරන්නේ ඇයි?

වනිතාව ඉන්ධන ලෙස යොද ගන්නා දර අපට මේ උදර සේවාව ඉටු කරන ගසෙහි ජීවය නොවන්නේද? ගස් කැපිය යුතු නොවේ යයි මම නොකියමි. විදෙසක එක් ගසක් කපන විට එහි කඳින්, ශාඛාවෙන් තබා කොලයක් හෝ අපතේ නොයන ලෙස ප්‍රයෝජන ගැනීම සිරිතයි. එහෙත් අප එක් ගසක් කපා හෙලන විට තවත් අනවශ්‍ය ගස් කීපයක්ද කපා හෙලමු. කිසිම දිනක ගස කින් උපරිම ප්‍රයෝජන නොගනිමු. අප දූව සඳහා කපන ගසෙහි ප්‍රයෝජනයට ගන්නේ කඳ පමණි. අනික් සියල්ලම අපට ඉන්ධනවේ. ඒ හැරුනු විට අපි කපන ගස් වෙනුවෙන් නව වන රෝපණයක් කරන්නෙමු ද? පසුගිය වසර කීපය තුල අක්කර 18,000 ප්‍රමාණයක ගස් කපන ලද නමුත් නැවත රෝපණය වූයේ 5% පමණ ප්‍රමා ණයකි. එසේ නම් අනාගතයේ එක්තරා දිනයක අපට තුරුලතා නැතිවීමේ හේතුවෙන් පරිසර හානි සිදුවූවා යැයි අසන්නට ලැබුනොත් එය විමතියක් නොවනු ඇත.

අප අද කපා හෙලන ගස් ප්‍රමාණය මේ ලෙසින්ම කරගෙන ගියහොත් පස සෝදා පාළුව වැඩිවී පස නිසරු වීම, ගංවතුර ගැලීම ආදිය සිදුවිය හැක. සෝදා යන පස් ප්‍රමාණය ගංගාවල තැන්පත් වී ගංගා ගලන වේගය අඩපන වී ජල විදුලි සැපයුමට බාධක වනු ඇත. සොබා දහමේ සුන්දරත්වය තුරු ලතා, මල්පල, වන සතුන් සියොතුන් විනාශවී යනු ඇත. එවන් විටක අද අපට විදෙස් විනිමය අතින් සංචාරක ව්‍යාපාරය වැනි කටයුතු අඩපණ වී යනු ඇත. එවිට තුරුලතා සමග අපටද හඬා වැටෙන්නට සිදුවනු ඇත:

ඉන්ධනයට දර නොගෙන අපට ජල විදුලියෙන් ලැබෙන විදුලිය, ඛණිජ තෙලින් ලැබෙන ගෑස් වායුව ආදිය උපයෝගි කර ගත හැකිය. නොඑසේ නම් අද අපි ඉන්ධන ලෙස භාවිතා නොකරන ගොම් වැරටි, කොල රොඩු වැනි දෑ



සංරක්ෂණයට අත්වැල: සාමූහිකත්වය



ඉන්ධන ලෙස යොදා ගත හැකිය. ඒ හැරුනු විට දුවෙන දර කැබැල්ලෙන් උපරිම ඵල ලැබෙන අයුරට අඟුරු වැනි දෑයක් ඉන්ධන ලෙස යොදා ගත හැකිය. අප අමතක නොකළ යුතු එක් දෑයක් ඇත. එනම්, දර අප සතු එකම ඉන්ධනය නොවන බවයි. එසේම දර ලෙස අප භාවිතා කරන දුව වර්ගය කුමක් ද යන්නත් තීරණය කළ යුතු වෙයි.

නිදසුනක් වශයෙන් ගසකින් වැටුනු මැරුණු අත්තක්, ඵල නොදෙන රබර් ගසක්, පොල් ගසක් වැනි දෑයක් ඉන්ධන ලෙස යොදා ගැනීම පමණක් නොවේ. එහෙත් ඊට පෙර අපට පොල් කඳ නිවසක දුව සඳහා භාවිතා කළ හැකිද යන්නත් සොයා බැලිය යුතුය. එසේ නම් එය ඒ සඳහා භාවිතා කර ඊට පසු ඉතිරිය දර සඳහා යොදා ගත හැක.

වත්මන් රජය මගින් සත්වාහාර ලෙසත් දර ඉන්ධන ලෙසත් හඳුන්වා දුන් ඉපිල් ඉපිල් වැනි දෑයක් ඔබත් වගා කර ඇත්ද? එය කෙටි කාලීනව මහඟු ඵල දෙන රුකකි. ඒ හැරුණ විට ඔබ ගෙමිදුලේ ඉන්දන මල් පැලෑටියක්සේ හෝ ආර්ථික ටිනාකමක් දෙන කරාබු හෝ කුරුඳු පැලයක් සේ හෝ ආදරයෙන් වෙනත් ගසක් රෝපනය කර ඇත්ද? කෙටියෙන් කිව හොත් අප මහළු වෙද්දී සමාජයේ අපගේ තැන හිස් නොවීමට නව පරපුරක් බිහි කරන ඔබ මහලු වී යන තුරු ලතා වෙනුවට අළුත් තුරුලතා බිහි කිරීමට උපකාරී වී ඇත්ද? එසේ නැතහොත් කුඩා දූ දරුවන් නලවන ආදරය තරම් ආදරයකින් තවමත් නොමේරූ ළදරු පැලෑටියක් දර ඉන්ධන සඳහා නොයොදා සිටීමට ඔබට හැකි වී ඇත්ද? වෙනත් අයුරකින් කිවහොත් වනාන්තර නැගුමට ඔබෙන් සිදු වී ඇති මෙහෙය කව රේද්දයි සිතන්න.

ඔබ වන වගාවන් මෙලෙස සිඳ බිඳ දැමීමට සැහැසි වන්නේ නම් ඉන්ධනයන් සඳහා කෝටු කැබැල්ලක් සොයා යන්නට සැතපුම් ගණනක් ඈතක හෝ වනයකට වදින්නට නැතහොත් විදුලිය සඳහා දහස් ගණනින් මුදල් වැය කරන්නට, පරිසර දූෂණයෙන් ඇති වන ලෙඩ දුකින් මිදෙන්නට, සියතුන්ගේ මද පවනේ මිහිරි නාදයෙන් ඔබට සැනසෙන්නට නොහැකි වන දිනයක් පැමිනෙනු නොඅනුමානයි. එනිසා අප විසින් කල යුතු එක් දෙයක් ඇත. එනම් වන සංරක්ෂණයයි. එය අපහසු දෑයක් නොවේ.

කැපෙන හෝ විනාශ වෙන සෑම ගසක් වෙනුවෙන්ම පැලයක් ඉන්දුවොත්, තිබෙන තුරු ලතා ආදරයෙන් සුරකීම කළොත්, ජාතියේ වැඩෙන පරපුරට ගසක අගය, කියාදී ඔවුනටද වන වගාවේ අරුමය පැහැදිලි කළොත් එය අපහසු දෙයක් නොවනු ඇත. කොටින්ම වනය රැකීම රජයේ යුතුකමක් නොව ඔබගේද මගේද යුතුකමක් බව සිතට ගත්දට එය ඉටුවී අභවර බව ඔබට පැහැදිලිය.



දරුපරපුරේ අනාගතයටත් සංරක්ෂණය අවශ්‍යයි.